SLGURU.LK

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

29 S I

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2020

Second Term Test - Grade 12 - 2020

විභාග අංකය ..............................

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I

කාලය පැය දෙකයි

- **අංක 1 සිට 50 දක්වා එක් එක් ප්‍රශ්නයට 1, 2, 3, 4, 5 යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන පිළිතුර තෝරා නියමිත අංකයේ කතිරයක් (x) යොදන්න.**

01. සන්නිවේදනය අධ්‍යයන විෂයය ශාස්ත්‍රීය විෂයයක් ලෙස ආයතන ගත කිරීමට පියවර ගනු ලැබුවේ,
    1. මහාචාර්ය විමල් දිසානායක මහතා ය.
    2. මහාචාර්ය විල්බර් ශ්‍රාම් මහතා ය.
    3. මහාචාර්ය එම්.ටී. ආරියපාල මහතා ය.
    4. මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර මහතා ය.
    5. මහාචාර්ය හැරල්ඩ් ඩී ලැස්වෙල් මහතා ය.

02. අදහස් දැනුම යනාදිය භාෂණය හෝ ලේඛණය හෝ සංඥා මගින් ප්‍රදානය කිරීම යන නිර්වචනය ප්‍රකාශ කරන ලද්දේ,
    1. චාල්ස් කුලී මහතා විසිනි.
    2. ෂැනොන් හා වීවර් යන මහත්වරු විසිනි.
    3. හැරල්ඩ්. ඩී. ලැස්වෙල් මහතා විසිනි.
    4. ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂය විසිනි.
    5. ගෲන්වල්ට් ප්‍රකාශය විසිනි.

03. අතථ්‍ය සන්නිවේදනයේ ප්‍රධාන සංරචකය වන්නේ,
    1. අන්තර්ජාලයයි.
    2. ගුවන් විදුලියයි.
    3. රූපවාහිනියයි.
    4. සිනමාවයි
    5. කැමරාවයි.

04. සංජානනය මූලිකාංගයක් වන්නේ කුමන සන්නිවේදන වර්ගයේ ද?
    1. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය
    2. සමූහ සන්නිවේදනය
    3. අන්තර් පුද්ගල සන්නිවේදනය
    4. මහජන සන්නිවේදනය
    5. ජන සන්නිවේදනය

05. 'සමාජ සංවිධානය' 'ජනමතය' හා ජනතාව හා ඔවුන්ගේ ගැටලු' යන කෘති ඉදිරිපත් කළ විද්වතුන්ගේ නම් සඳහන් වරණය, වන්නේ,
    1. කර්ට් ලෙවින්, කාර්ල් අයිවර් හවුලන්ඩ්, ක්ලෝඩ් ෂැනොන් ය.
    2. හැරල්ඩ් ඩී. ලැස්වෙල්, වොරන් වීවර්, විල්බර් ශ්‍රාම් ය.
    3. රේ එල්ඩන් හයිබර්ට්, ඩොනල්ඩ් ආර් අන්ගුරේට්, තෝමස් ඩබ්ලිව් බෝන් ය.
    4. චාල්ස් කුලි, වෝල්ටර් ලිප්මාන්, ජෝන් ඩූවී ය.
    5. කර්ට් ලෙවින්, ඩොනල්ඩ් ආර් අන්ගුරේට්, වොරන් වීවර් ය.

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

06. පහත දැක්වෙන්නේ පාසැලේ සිසු සිසුවියන් කණ්ඩායම් ගතව විෂය කරුණු සාකච්ඡා කිරීමේදී ලබාගත් ප්‍රකාශනයන් ය.

A - සංජානනය මූලිකාංගයකි

B - පංච ඉන්ද්‍රියන්ට දැනෙන උත්තේජන මත ප්‍රතිචාර දැක්වීම.

C - වඩා තීව්‍ර සහවේදනයකට අවකාශ සැලසීම.

ඉහත ප්‍රකාශ අතුරින් අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයට අයත් වන්නේ,

1. A පමණි. 2. A,B,C පමණි. 3. B C පමණි. 4. B පමණි. 5. A,B පමණි.

07. ජන සන්නිවේදනය සතු ලක්ෂණයක් වන්නේ,

1. පොදු පණිවිඩ විසරණය නොවීම.
2. තරඟකාරීත්වයක් නොමැති වීම
3. ප්‍රතිපෝෂණය ක්ෂණිකව ලැබීම
4. වෘත්තීය මාධ්‍යවේදීන් දක්නට නොලැබීම.
5. සන්නිවේදකයා හා ග්‍රාහකයා අභිමුඛ නොවීම.

08. ඇරිස්ටෝටල් ආකෘතිය සම්බන්ධයෙන් කරුණු කීපයක් පහත දැක්වේ.

A - ප්‍රතිචාර ප්‍රතිපෝෂණය පිළිබඳව සඳහන් වීම.

B - ඒක මාර්ගික ආකෘතියක් වීම.

C - මූලික අංග පහක් පිළිබඳව අවධානය යොමු කිරිම.

1. A පමණි. 2. B පමණි. 3. A B පමණි. 4. B, C පමණි. 5. A,B,C පමණි.

09. ජන සන්නිවේදන මාධ්‍ය අතර වඩාත් ප්‍රචලිත මාධ්‍ය ලෙස සැලකිය හැක්කේ,

1. රූපවාහිනිය 2. ගුවන් විදුලිය 3. පුවත්පත 4. අන්තර්ජාලය 5. සඟරා

10. ශ්‍රී ලංකාවට මුද්‍රිත මාධ්‍ය හඳුන්වා දෙන ලද්දේ,

1. ඉංග්‍රීසීන් විසිනි 2. ප්‍රංශ ජාතිකයන් විසිනි 3. ලන්දේසීන් විසිනි
4. ජර්මන් ජාතිකයන් විසිනි 5. ඉන්දියානුවන් විසිනි

11. නිර්වාචික සන්නිවේදනය ඉතා ප්‍රබල ලෙස සහ කලාත්මක ලෙස භාවිතා කළ හැකි සන්නිවේදන මාධ්‍ය විශේෂයක් වන්නේ,

1. බලිතොවිල් - ගුවන්විදුලිය
2. මුහුණුපොත - යුටියුබ්
3. රූපවාහිනිය - සිනමාව
4. පුවත්පත - ග්‍රන්ථය
5. ගුවන්විදුලිය - පුවත්පත

12. අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයේදී තොරතුරු රැස්කරගනු ලබන්නේ,

1. පොත්පත් කියවීම තුළිනි
2. අත්දැකීම් පාදක කර ගැනීම තුළිනි.
3. පංචේන්ද්‍රිය උපයෝගී කර ගැනීම තුළිනි
4. අන්තර් පුද්ගල සන්නිවේදනය තුළිනි
5. ජනමාධ්‍ය උපයෝගී කර ගැනීම තුළිනි

13. Hub ආකෘතිය පිළිබඳ කරුණු ඉදිරිපත් කළ විද්වතුන් තිදෙනා වන්නේ,

1. එල්ඩන් හා හර්බට්, ෂැනොන් හා විවර්, විල්බර් ශ්‍රාම්
2. එල්ඩන් හා හර්බට්, ඩොනල් ආර් අන්ගුරේටි, තෝමස් ඔබ් බොන්
3. විල්බර් ශ්‍රාම්, විමල් දිසානායක, ෂැනෝන් හා විවර්
4. කර්ල් අයිවර් හව්ලන්ඩ්, කර්ට් ලෙවින්, ලැසාස්ෆෙල්ඩ්
5. කර්ල් අයිවර් හව්ලන්ඩ්, වොරන් වීවර්, විල්බර් ශ්‍රාම්

14. ව්‍යාපාරිකයෝ, රැකියාවල නිරත සහ රැකියා අපේක්ෂා කරන්නෝ ස්වකීය ජීව දත්ත, ඇතුළත් කරමින් නිර්මාණය කර ඇති වෙබ් අඩවිය කුමක්ද?

1. Pinterest 2. Linkedin 3. Twitter 4. Facebook 5. Instagram

SLGURU.LK

For Educational Purpose Only

SLGURU.LK

15. බොහෝ පිරිසකගේ සිට එක් පුද්ගලයකුට එරෙහිව සිදුකරන සන්නිවේදනය කවර නමකින් හැඳින්වේද?
    1. Online Petion
    2. You tube - web post
    3. Bloging
    4. E - mail
    5. Twitter

16. පහත ඒවායින් නව මාධ්‍ය පමණක් අඩංගු වචන ඛණ්ඩය තෝරන්න.
    1. රූපවාහිනිය, ගුවන්විදුලිය, පුවත්පත
    2. වෙබ් අඩවි, Facebook, වෙළඳ දැන්වීම්
    3. සැටලයිට්, රූපවාහිනිය, Facebook
    4. Skype, Facebook, ගුවන් විදුලිය
    5. Facebook, E-mail, වෙබ් අඩවි

17. සයිබර් හිරිහැර හා උවදුරු, ප්‍රචණ්ඩ ක්‍රියාවලට පෙළඹීම, වැරදි තොරතුරු පළ කිරිම, ව්‍යාජ ගිණුම් සැකසීම අයත් වන්නේ,
    1. නූතන මාධ්‍යයේ අයහපත් බලපෑමයි.
    2. නව මාධ්‍යයේ අයහපත් බලපෑමයි.
    3. ජන මාධ්‍යවල අයහපත් බලපෑමයි.
    4. සමාජ මාධ්‍යයේ අයහපත් බලපෑමයි.
    5. සියලු මාධ්‍යවල අයහපත් බලපෑමයි.

18. සන්නිවේදන ක්‍රියාවලිය තුළ එහි ව්‍යුහාත්මක ස්වරූපය හඳුනාගත හැකි මූලිකාංග වනුයේ,
    1. සන්නිවේදකයා, සංදේශය හා මාධ්‍ය
    2. සන්නිවේදකයා, මාධ්‍යය හා ප්‍රතිපෝෂණය
    3. තොරතුරු මුලාශ්‍ර, සන්නිවේදකයා, හා ග්‍රාහකයා
    4. සන්නිවේදකයා, සංදේශය හා ග්‍රාහකයා
    5. සන්නිවේදකයා, බාධක හා ග්‍රාහකයා

19. විදුහල්පතිවරයා කළ කතාව තේරුම් ගැනීමට ගත් උත්සාහයේ දී සිසු සිසුවියන් තුළ සිදු වන්නේ,
    1. ආකේතිකරණය
    2. විකේතිකරණය
    3. ප්‍රතිනිර්මාණය
    4. සම්ප්‍රේෂණය
    5. පරිවර්තනය

20. සන්නිවේදනය සම්බන්ධයෙන් වඩාත් නිදොස් ප්‍රකාශය තෝරන්න.
    1. සන්නිවේදන ක්‍රියාවලියේ සියලු පණිවිඩ තොරතුරු සම්පාදනය කරයි.
    2. සන්නිවේදනයේ මූලික අරමුණු බලපෑමක් ඇති කරයි.
    3. ග්‍රාහකයා නැති තැන සන්නිවේදනයක් සිදු නොවේ.
    4. සන්නිවේදන ක්‍රියාවලියේ සන්නිවේදන හා ග්‍රාහක භූමිකා ස්ථාවරව පවතී.
    5. සන්නිවේදනය සංකේත හුවමාරු ක්‍රියාවලියකි.

21. සන්නිවේදන ක්‍රියාවලියක සන්නිවේදකයා යනු,
    1. තනි පුද්ගලයකි.
    2. කණ්ඩායමකි.
    3. සංවිධානයකි.
    4. ආයතනයකි.
    5. ඉහත ඕනෑම අවස්ථාවක් විය හැකියි.

22. සන්නිවේදනය ශාස්ත්‍රීය විෂය ක්ෂේත්‍රයක් ලෙස අධයයනය කිරිම කෙරෙහි අවධානය යොමු වන්නේ කුමන සියවසේ දී ද?
    1. 19 වන සියවසේදී මුල් භාගයේ දී
    2. 17 වන සියවසේ අග භාගයේ දී
    3. 20 වන සියවසේ මුල් භාගයේ දී
    4. 16 වන සියවසේ මුල් භාගයේ දී
    5. කාර්මික විප්ලවයට පෙර සිට

23. අන්තර් පුද්ගල සන්නිවේදනය දෛනික ජීවිතයේ අත්‍යවශ්‍ය සන්නිවේදන අවස්ථාවක් වන්නේ අනෙකුත් සන්නිවේදන වර්ගයන්ට සාපේක්ෂව
    1. විවිධ පාර්ශවල අවධානය දිනා ගැනීමට හැකිවන නිසාය.
    2. කිසියම් මතයක් නිර්මාණය කිරීමට ඇති හැකියාව නිසාය.
    3. පෙළඹවීමේ හැකියාව වැඩි නිසාය.
    4. ප්‍රතිරූප ගොඩනංවා ගැනීමට උදව් වන නිසාය.
    5. සමාජීය පොදු කාර්යයවලදී ඉවහල් වන නිසාය.

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

24. පාසැලේ ප්‍රාථමික ශ්‍රේණියේ සිට සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යාපනය ලබාදිය යුතු බවට නිර්දේශ කරන ලද්දේ,
    1. එක්සත් ජාතීන්ගේ සංගමය විසිනි
    2. ඇමරිකාවේ ඉලිනොයිස් විශ්ව විද්‍යාලය විසිනි
    3. යුනිසෙෆ් සංවිධානය විසිනි
    4. යුනෙස්කෝ සංවිධානය විසිනි
    5. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසිනි

25. සන්නිවේදන ක්‍රියාවලිය සාර්ථක වීමට නම්,
    1. සන්නිවේදකයා හා ග්‍රාහකයා දුරස්ථ නොවිය යුතුය.
    2. සංදේශ හුවමාරුව සඳහා තාක්ෂණික මෙවලම් භාවිතා විය යුතුය.
    3. සන්නිවේදක - ග්‍රාහක පාර්ශව අතර සමාන ආකාරයේ පූර්ව අත්දැකීම් වැඩි ප්‍රමාණයක් තිබිය යුතුය.
    4. සන්නිවේදකයා හා ග්‍රාහකයා එකම සමාජ ක්‍රමයකට අයත් විය යුතුය.
    5. සන්නිවේදකයාට සංදේශකරණය පිළිබඳ මනා අවබෝධයක් තිබිය යුතුය.

26. අභිමුඛ පුද්ගලාන්තර සන්නිවේදනය යනු?
    1. තාක්ෂණික උපකරණ මාර්ගයෙන් සජීවීව සන්නිවේදනයේ යෙදීම.
    2. ඕනෑම ප්‍රදේශයක සිට තොරතුරු හුවමාරු කර ගැනීමේ හැකියාව
    3. අන්තර්ජාල සේවාවන් ඔස්සේ තොරතුරු හුවමාරුව
    4. පුද්ගලයන් දෙදෙනෙකු මුහුණට මුහුණලා සජීවීව සන්නිවේදනයේ යෙදීම.
    5. පුද්ගලයන් කිහිප දෙදෙනෙකු තාක්ෂණය ඔස්සේ සජීවී ලෙස සන්නිවේදනය යෙදීම.

27. රජයේ ලියාපදිංචි කළ ප්‍රථම සිංහල පුවත්පත,
    1. ලංකා ලෝකයයි
    2. සිංහල බෞද්ධයායි.
    3. ලක්මිණි පහනයි.
    4. ද කලම්බු ජර්නල් පුවත්පතයි
    5. රජයේ ගැසට් පත්‍රයයි.

28. කථන සන්නිවේදන කුසලතා වර්ධනයට හේතු වන සාධකය මින් කුමක්ද?
    1. සවන් නොදීම
    2. කියවීමට මැලි වීම
    3. දක්ෂ කථිකයන්ගේ කතා අනුකරණය නොකිරීම
    4. හඬනගා උච්චාරණය කිරීම
    5. ඉගැන්වීම, උපදෙස් දීම හා මඟ පෙන්වීම

29. ආකේතකරණය, අර්ථ නිරූපණ, සංදේශය, විකේතකරය යන ලක්ෂණ දක්නට ලැබෙනුයේ,
    1. ඩේවිඩ් කේ බර්ලෝ ආකෘතිය තුළය.
    2. ඇරිස්ටෝටල් ආකෘතිය තුළය.
    3. හැරල්ඩ් ඩී. ලැස්වෙල් ආකෘතිය තුළය.
    4. ඔස්ගුඩ් - ශ්‍රාම් ආකෘතිය තුළය.
    5. ශැනොන් - වීවර් ආකෘතිය තුළය.

30. අන්තර් පුද්ගල සන්නිවේදනයේ ප්‍රයෝජනයක් වන්නේ මින් කුමක්ද?
    1. වඩාත් පහසුවෙන් අන්තර් ක්‍රියාකාරී සන්නිවේදනයක යෙදීමට ඇති නොහැකියාව.
    2. අනෙකුත් සන්නිවේදන වර්ගවලට සාපේක්ෂව පෙළඹවීමේ හැකියාව අඩු වීම.
    3. අන්තර් සම්බන්ධතා වර්ධනය කර ගැනීමට නොහැකිවීම.
    4. විචාරශීලීත්වය වර්ධනය කර ගැනීම.
    5. පහසුවෙන් අන්‍යෝන්‍ය අවබෝධය හා විශ්වාසය තහවුරු කර ගත හැකිවීම.

31. සමූහ සන්නිවේදනය සාර්ථක කර ගත හැකි විධි ක්‍රමයක් වන්නේ,
    1. මුහුණට මුහුණලා කෙරෙන සන්නිවේදන තුළිනි.
    2. ආචාරශීලී නොවී සන්නිවේදනයේ යෙදීමෙනි.
    3. ස්ව සංකල්ප පෝෂණය තුළිනි.
    4. වාචික මෙන්ම නිර්වාචික සන්නිවේදන විධික්‍රම භාවිතය තුලිනි.
    5. අතිවිශාල පිරිසක් එකවර ඉලක්ක කර ගනිමින් සන්නිවේදනයේ යෙදීම තුළිනි.

SLGURU.LK

For Educational Purpose Only

SLGURU.LK

32. HUB ආකෘතියේ ප්‍රධාන අංග අතර හතර වන ස්ථානය මින් කුමක්ද?
1. සන්නිවේදකයෝ 2. පෙරහනු 3. බලපෑම 4. දොරටු පාලකයෝ 5. ජනමාධ්‍ය

33. රූපණය යන්නෙහි අදහස,
1. මුවින් පිටවන වචන හා ශබ්ද අනුසාරයෙන් විවිධ අර්ථ ජනනය කිරීම.
2. ක්‍රියාකාරකමක් වශයෙන් හෝ වෘත්තියක් වශයෙන් යම් රංගනයක යෙදීම.
3. කිසියම් භාෂාවක පවතින ශබ්ද රටා හා වචන රටා භාවිතා කිරීම.
4. සවන්දීම පදනම් කරගත් ශබ්ද මාධ්‍යයේ වර්ධනය
5. භාෂාව හා සංකේත මගින් තොරතුරු ඉදිරිපත් කිරීම.

34. 


ඉහත දක්වා ඇති ඇරිස්ටෝටල් ආකෘතියේ සන්නිවේදන ක්‍රියාවලිය සඳහා අත්‍යාවශ්‍ය මූලිකාංග 05 දක්වා ඇත. ඒවා නම්,
1. A බලපෑම, B ග්‍රාහකයෝ, C කථාව, D කථනය, E අවස්ථාව
2. A ග්‍රාහකයෝ, B කථාව, C කථිකයා, D බලය, E අවස්ථාව
3. A කථාව, B කථිකයා, C බලපෑම, D අවස්ථාව, E ග්‍රාහයකයෝ
4. A අවස්ථාව, B ග්‍රාහකයෝ, C බලපෑම, D කථාව, E කථිකයා
5. A කථිකයා, B කථාව, C ග්‍රාහකයෝ, D බලපෑම, E අවස්ථාව

35. සාම්ප්‍රදායික මාධ්‍යයේ සුවිශේෂිතාවක් වන්නේ මින් කුමක්ද?
1. සංස්කෘතික සන්දර්භය 2. භාව ප්‍රකාශන 3. ජාලගතකරණය
4. ස්වයංකරණය 5. සරල ජංගමශීලි මාධ්‍යයකි

36. සන්නිවේදනය පිළිබඳ න්‍යායාත්මක කරුණු ඇතුළත් ආකෘතියක් නොවන්නේ මින් කුමක්ද?
1. ඇරිස්ටෝටල් ආකෘතිය
2. හැරල්ඩ් ඩී ලැස්වෙල් ආකෘතිය
3. පෝල් ලැසාස් ෆෙල්ඩ් ආකෘතිය
4. ශැනන් හා වීවර් ආකෘතිය
5. ඔස්ගුඩ් - ශ්‍රාම් ආකෘතිය

37. නිර්මලා උසස් පෙළ සන්නිවේදනය විෂය හදාරණ ශිෂ්‍යාවකි. ඇය විනෝද ගමනක් යමින් සිටියදී ගුවන් විදුලියේ විකාශනය වූ ගීතයක් රස විඳිමින් ගියාය. ඈ තුළ සිදු වූ සන්නිවේදන වර්ගය කුමක්ද?
1. ජන සන්නිවේදනය 2. මහජන සන්නිවේදනය
3. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය 4. අන්තර් පුද්ගල සන්නිවේදනය
5. සමූහ සන්නිවේදනය

38. යම් ක්ෂේත්‍රයක් අරමුණු කරගෙන හෝ යම් පාඨක පිරිසක් ඉලක්ක කරගෙන නිශ්චිත කාල සීමාවලදී පළ වන කෙටි ලිපි හට රූප සටහන් සහිත ප්‍රකාශනයක් හඳුන්වන්නේ,
1. පුවත්පතක් ලෙසය 2. සඟරාවක් ලෙසය 3. පොත් පිංචක් ලෙසය
4. අත්පත්‍රිකා ලෙසය 5. දින සටහන් ලෙසය.

39. සමාජ මාධ්‍යයේ ප්‍රබලතාවයක් වන්නේ,
1. එක් මාධ්‍යකින් තව මධ්‍යකට යාමට හැකි වීම. 2. සරල පිරිවැය අධික ක්‍රමයකි.
3. ඉගෙනුම් ක්‍රියවලියට වැදගත් නොවීම. 4. නම්‍යශීලී මාධ්‍යයකි.
5. බහුවිධ දොරටුපල ක්‍රියාවලියකට නොවීම.

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

40. ලිඛිත සන්නිවේදනය සම්බන්ධයෙන් නිරවද්‍ය ප්‍රකාශය වන්නේ,
    1. සාක්ෂරතාව අත්‍යාවශ්‍ය නොවේ.
    2. ව්‍යාකරණ භාවිතය වැදගත් නොවේ.
    3. කථන සන්නිවේදනයට සාපේක්ෂ වඩාත් සංවිධානාත්මකව ගොඩනැගිය හැකිවේ.
    4. ලිපි, පුවත්පත්, සගරා පමණක් සන්නිවේදනයට යොදා ගනී.
    5. අනාගත භාවිතය සඳහා තොරතුරු ගබඩා කර තැබීමේ හැකියාව නොමැත.

41. ලෝක ව්‍යාප්ත ජාලය (World wide, Web - www) පිළිබඳ අදහස ඉදිරිපත් කල විද්‍යාඥයා කවුරුන්ද?
    1. චාල්ස් කුලි මහතා විසිනි
    2. ෂැනොන් සහ වීවර් මහතා විසිනි
    3. ටිම් බර්නස් ලී මහතා විසිනි
    4. වෝල්ටර් ලිප්මාන් මහතා විසිනි
    5. කර්ල් අයිවර් හවුලන්ඩ් මහතා විසිනි

42. සාම්ප්‍රදායික මාධ්‍යයේ වැදගත්කමක් වන්නේ,
    1. සරල ව්‍යුහයක් සහිත වීම
    2. තේමාත්මක අන්තර්ගතය
    3. නම්‍යශීලීත්වය
    4. උපදේශාත්මක සන්දේශ ජනනය කළ හැකි වීම
    5. අවම පිරිවැය

43. දෘශ්‍ය සන්නිවේදන කුසලතා වර්ධනයට හේතු වන කරුණක් වන්නේ මින් කුමක්ද?
    1. රූප මැනවින් නොදැකීම.
    2. රූප හඳුනා නොගැනීම
    3. අධ්‍යාපනික කාර්ය සඳහා භාවිතයට නොගැනීම
    4. විවිධ හඬවල් වෙන් කර හඳුනා නොගැනීම
    5. දෘශ්‍ය සන්නිවේදන අංග යොදා ගනිමින් නිර්මාණ කිරීම.

44. සන්නිවේදන අධ්‍යනය ශාස්ත්‍රීය විෂය ක්ෂේත්‍රයක් ලෙස ආයතන ගත කිරීමට පියවර ගනු ලැබුවේ.
    1. මහාචාර්ය විමල් දිසානායක මහතා විසිනි.
    2. මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර මහතා
    3. මහාචාර්ය එම්.ටී. ආරියපාල මහතා
    4. මහාචාර්ය විල්බර් ශ්‍රාම් මහතා
    5. මහාචාර්ය හැරල්ඩ් ඩී. ලැස්වෙල් මහතා

45. සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයන විෂය ඉගැන්වූ ප්‍රථම කථිකාචාර්යවරුන් දෙදෙනා වන්නේ කවුද?
    1. මහාචාර්ය විමල් දිසානායක මහතා සහ මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර මහතා
    2. මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර මහතා සහ ආචාර්ය එඩ්වන් ආරියදාස මහතා
    3. ආචාර්ය එඩ්වන් ආරියදාස මහතා සහ ආචාර්ය පියසෝම මෙන්ඩිස් මහතා
    4. ආචාර්ය පියසෝම මෙන්ඩිස් මහතා සහ ඩී.බී. නිහාල්සිංහ මහතා
    5. මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍ර මහතා හා ආචාර්ය එඩ්වඩ් ආරියදාස මහතා

46. සන්නිවේදනය යන පදයේ පෘථුල අර්ථය වන්නේ,
    1. 'දැනගත් දේ දැන ගැනීමට සැලැස්වීම'
    2. 'පොදු බවට පත් කිරීම'
    3. ' මැනවින් දැනුම් දීම'
    4. 'සබඳතා පැවැත්වීමේ ක්‍රියාවලිය'
    5. ' තොරතුරු ගැනීම හා දීම'

47. සන්නිවේදන ක්‍රියාවලිය තුල ප්‍රදීපාගාර උපක්‍රම යනුයෙන් සංකල්පයක් පවතී. මෙය වඩාත් අදාල වන්නේ,
    1. දෘශ්‍ය සන්නිවේදනයට
    2. ජන සන්නිවේදනයට
    3. සමූහ සන්නිවේදනයට
    4. අවධිමත් සන්නිවේදනයට
    5. අන්තර් පුද්ගල සන්නිවේදනයට

48. ගමේ පැවැත්වෙන භාණ්ඩ සල්පිල පිළිබඳ ප්‍රදේශවාසීන් දැනුවත් කළ හැකි වඩාත් හොඳ මාධ්‍ය වන්නේ,
    1. පෝස්ටර්, අත්පත්‍රිකා, ජංගම ශබ්ද විකාශන රථ
    2. ගුවන්විදුලිය, රූපවාහිනිය, අන්තර්ජාලය
    3. කෙටි පණිවිඩ, පෝස්ටර්, ගුවන්විදුලිය
    4. දුරකථන ඇමතුම්, පෝස්ටර්, අත් පත්‍රිකා
    5. පුවත්පත්, දුරකථන ඇමතුම්, ජංගම ශබ්ද විකාශන රථ

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

49. සන්නිවේදන අධ්‍යයනය නම් විෂය ධාරාවක් ඇතිවීම කෙරෙහි මුල් වූ විෂය ක්ෂේත්‍රය හා ඒ හා මුල් වූ පුද්ගලයින් පහත දැක්වේ.

A - සමාජ විද්‍යාව - චාල්ස් හෝර්ටන් කුලි

B - මනෝ විද්‍යාව - ජෝන් ඩුවී

C - වෛද්‍ය විද්‍යාව - එඩ්වඩ් ලුවිස් බර්නෝඩ්

D - දේශපාලන විද්‍යාව - වෝල්ටර් ලිප්මාන්

E - ඉංජිනේරු විද්‍යාව - හැරල්ඩ් ඩී ලැස්වෙල්

ඉහත ක්ෂේත්‍ර ඇසුරින් සන්නිවේදන අධ්‍යයනය තම විෂය ධාරාව ඇතිවීම කෙරෙහි මුල් වූ විෂයන් හා පුද්ගලයින් ඇතුළත් නිවැරදි පිළිතුරු කාණ්ඩය තෝරන්න.

1. A, B, C 2. A, B, D 3. B, C, D 4. C, D, E 5. A, B, C, D, E

50. ප්‍රාථමික සමාජයන්හි විසූ ජනයා සිය සරල අවශ්‍යතා සපුරා ගත්තේ,

1. සංඥා, ශබ්ද, සංකේත මගිනි.
2. ප්‍රාථමික භාෂාව මගිනි.
3. චිත්‍ර, දුම් හා භාෂාව මගිනි.
4. අකුරු, දුම්, කොළ අතු මගිනි.
5. චිත්‍ර, රූප සටහන් හා සංඥා මගිනි.

SLGURU.LK
For Educational Purpose Only

"The expert in anything was once a beginner." — Helen Hayes

Visit SLGURU.LK to download papers and notes.

SLGURU.LK

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

29 S II

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2020

**Second Term Test - Grade 12 - 2020**

විභාග අංකය ............................ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II කාලය පැය තුනයි

- **ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. (i) කවුරුන්, කුමක්, කුමන මාධ්‍යයකින් කවරෙකු හට කුමන බලපෑමක් සඳහා සන්නිවේදනය කරයි ද එය සන්නිවේදනය නම් වේ. මෙය කාගේ නිර්වචනයක්ද? (ල. 2)

(ii) පෙන්සෙල්වේනියානු විශ්වවිද්‍යාලයීය පර්යේෂණ කණ්ඩායම විසින් ප්‍රචණ්ඩත්වය ක්‍රියා නරඹන ළමුන්ගේ හඳුනාගත් ලක්ෂණ දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 4)

(iii) සාම්ප්‍රදායික මාධ්‍ය පරිසර හිතකාමී සරල සන්නිවේදන භාවිතයකි. ඒවායෙහි සුවිශේෂතා හතරක් නම් කර දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 6)

(iv) සමාජ මාධ්‍යයේ යහපත් බලපෑම් දෙකක් හා අයහපත් බලපෑම් දෙකක් විග්‍රහ කරන්න. (ල. 8)

02. (i) මහාචාර්ය විල්බර්ශ්‍රාම් දක්වන පරිදි ජනමාධ්‍යයෙන් ඉටුකරන ප්‍රධාන භූමිකා දෙකක් නම් කරන්න. (ල. 2)

(ii) ගුවන් විදුලිය පළමු විද්‍යුත් ජනමාධ්‍ය වේ. ගුවන් විදුලියේ මූලික ලක්ෂණ හතරක් නම් කර එකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 4)

(iii) ප්‍රධාන සන්නිවේන වර්ග හය නම් කර සමූහ සන්නිවේදනය යන්න විස්තර කරන්න. (ල. 6)

(iv) සාම්ප්‍රදායික මාධ්‍ය විධික්‍රම හතරක් දක්වා ඉන් දෙකක් පිළිබඳ උදාහරණ සහිතව විස්තර කරන්න. (ල. 8)

03. (i) සන්නිවේදන විෂය ක්ෂේත්‍රයට ඇතුළත් වන පාඨමාලාවක් විධිමත් ආකාරයෙන් ප්‍රථම වරට හඳුන්වා දුන් විශ්ව විද්‍යාලය කුමක්ද? එම පාඨමාලාව කුමක්ද? (ල. 2)

(ii) සන්නිවේදනය යන්න කරුණු හතරක් ඔස්සේ හඳුන්වා දෙන්න. (ල. 4)

(iii) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය ඔබගේ පෞද්ගලික ජීවිතය සංවර්ධනයට දායකවන ආකාරය කරුණු තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල. 6)

(iv) සන්නිවේදකයා සංදේශයක් ලබාදුන් පසු ග්‍රාහකයා ඒ සම්බන්ධයෙන් සන්නිවේදකයා වෙත ලබා දෙන හඳුනා ගත හැකි ආකාරයේ ප්‍රතිචාරය කුමන නමකින් හඳුන්වයි ද? එහි වැදගත්කම කරුණු 03 ක් මගින් පැහැදිලි කරන්න. (ල. 8)

SLGURU.LK



For Educational Purpose Only

SLGURU.LK

04. (i) වාචික සන්නිවේදනය යන්න හඳුන්වන්න. (ල. 2)

(ii) ජන සන්නිවේදන ක්‍රියාවලියට සම්බන්ධවන විවිධ ප්‍රධාන අංග පිළිබඳ HBU ආකෘතිය මගින් විග්‍රහ කෙරේ. එමගින් දක්වන අංග 04 නම් කර ඉන් එක් අංගයක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 4)

(iii) Facebook ඉතාමත් ජනප්‍රිය සමාජ මාධ්‍ය යෙදවුමක් වේ. මෙය සමාජ ප්‍රවර්ධනය සඳහා යොදාගත හැකි ආකාරය කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 6)

(iv) ජනකවි හා ජන කතා නූතන නිර්මාණකරණය තුළ යොදා ගන්නා අවස්ථා හතරක් පැහැදිලි කරන්න.

(ල. 8)

05. (i) ජනමාධ්‍ය වර්ගීකරණය කරන්න. (ල. 2)

(ii) සන්නිවේදන අධ්‍යයන ක්ෂේත්‍රය ස්වාධීන විෂයයක් ලෙස වැඩීමටත්, ගැඹුරින් අධ්‍යයනය කිරීමටත් බලපෑ ප්‍රධාන හේතු දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 4)

(iii) මුද්‍රිත මාධ්‍ය තුළ ඇතිවිය හැකි සන්නිවේදන බාධක දෙකක් නිදසුන් මගින් පැහැදිලි කරන්න.

(ල. 6)

(iv) ෂැනොන් හා විවර් ආකෘතිය ඇඳ කෙටියෙන් පැහැදිලි කරන්න. මෙම ආකෘතියේ විශේෂතා දෙකක් ඔස්ගුඩ් ශ්‍රාම් ආකෘතියේ විශේෂතා සමඟ සසඳන්න. (ල. 8)

06. (i) සන්නිවේදනය පිළිබඳ ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂයේ නිර්වචනය ලියන්න. (ල. 2)

(ii) මහජන සන්නිවේදනයේ ප්‍රයෝජන හතරක් ලියා එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 4)

(iii) ජනමාධ්‍යයේ විශේෂතා තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 6)

(iv) විදුහල්පතිතුමා සිය ගුරුමණ්ඩලය සමඟ සාකච්ඡා කරමින් ඉදිරි වර්ෂය සඳහා වැඩ සැලසුම් කළේය. එසේ සාකච්ඡා කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභ හතරක් විස්තර කරන්න. (ල. 8)

07. (i) ගැමි නාටක යන්න හඳුන්වන්න. (ල. 2)

(ii) දෘශ්‍ය සන්නිවේදනය යන්න කරුණු දෙකක් යටතේ කෙටියෙන් විස්තර කරන්න. (ල. 4)

(iii) 'සන්නිවේදනය විවිධාකාර වේ' මෙම කියමන සනාථ කිරීම සඳහා කරුණු තුනක් විස්තර කරන්න.

(ල. 6)

(iv) නව මාධ්‍යවල දක්නට ලැබෙන කැපී පෙනෙන ලක්ෂණ හතරක් විස්තර කරන්න. (ල. 8)

SLGURU.LK

For Educational Purpose Only

“The expert in anything was once a beginner.” — Helen Hayes

SLGURU.LK

Visit SLGURU.LK to download papers and notes.

SLGURU.LK

## දෙවන වාර පරීක්ෂණය - 2020 - 12 ශ්‍රේණිය - සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

## I කොටස

### පිළිතුරු පත්‍රය

| | | | | |
|---|---|---|---|---|
| 01. - 1 | 11. - 3 | 21. - 5 | 31. - 4 | 41. - 3 |
| 02. - 4 | 12. - 3 | 22. - 3 | 32. - 5 | 42. - 4 |
| 03. - 1 | 13. - 1 | 23. - 3 | 33. - 2 | 43. - |
| 04. - 1 | 14. - 2 | 24. - 4 | 34. - 5 | 44. - 4 |
| 05. - 4 | 15. - 1 | 25. - 3 | 35. - 1 | 45. - 1 |
| 06. - 5 | 16. - 4 | 26. - 4 | 36. - 3 | 46. - 1 |
| 07. - 5 | 17. - 4 | 27. - 3 | 37. - 3 | 47. - 3 |
| 08. - 4 | 18. - 4 | 28. - 4 | 38. - 2 | 48. - 1 |
| 09. - 1 | 19. - 2 | 29. - 4 | 39. - 1 | 49. - 2 |
| 10. - 3 | 20. - 4 | 30. - 5 | 40. - 3 | 50. - 1 |

## II කොටස පිළිතුරු

01. (i) සන්නිවේදනය පිළිබඳ හැරල්ඩ් ඩී ලැස්වෙල්ගේ නිර්වචනයයි. (ල. 2)

(ii) වේදනාත්මක දේ පිළිබඳ දරුවන්ගේ සංවේදීතාව අඩුවීම.
දරුවන් ඔවුන් ජීවත්වන පරිසරය හා අවට ලෝකය පිළිබඳ බියක් ඇති කර ගැනීම.
අන් අය සමඟ කටයුතු කිරීමේදී ඉක්මනින් ආක්‍රමණශීලි වීම හා ආරවුල් ඇති කර ගැනීමට නැඹුරු වීම. (ල. 4)

(iii) * සරල ව්‍යුහය * තේමාත්මක අන්තර්ගතය * නම්‍යශීලීත්වය * සංස්කෘතික සන්දර්භය
* අවම පිරිවැය **නම් කිරීමට ල. 02 විස්තර 2 x 2**

(iv) යහපත් බලපෑම
*පරිහරණය කරන පුද්ගලයාට ඇතැම් විට අන්තර්ගතය සංස්කරණය කල හැකිවීම.
*පරිශීලකයාගේ අභිමතය අනුව පරිහරණය කළ හැකිවීම.
*ග්‍රාහකයාට කැමති ලෙස පරිහරණය කළ හැකිවීම.
*ක්ෂණික බව *ජනමාධ්‍යවලට සහාය ලබාදීම
අයහපත් බලපෑම
*මානසික අවපීඩනය, කනස්සල්ල, දරුණු හුදකලාව බේද ජනක සියදිවි නසා ගැනීම් වැනි ගැඹුරු මානසික හා සමාජීය කම්පන ඇති කිරීම, සමාජිකයන්ගේ පෞද්ගලික දත්ත සමාජ ජාල සංවිධාන වෙතින් පාර්ශවයන් වෙත ලබාදීම
පෞද්ගලිකත්වය පිළිබඳ ගැටලු මතුවීම *ස්ථාන හෙළිදරව් වීම හා අවසරයකින් තොරව
*පරිශීලකයාගේ ගිණුම්වලට ඇතුළු වීම.
*සාමාජිකයන්ගේ පෞද්ගලික දත්ත සමාජ ජාල සංවිධාන විසින් වෙනත් පාර්ශවයන් වෙත ලබාදීම.
*සයිබර් හිරිහැර උවදුරු **(ලකුණු 8)**

02. (i) * ආරක්ෂකයකුගේ භූමිකාව *ගුරුවරයෙකුගේ භූමිකාව * සාකච්ඡා මණ්ඩපයක භූමිකාව **(ලකුණු 2)**

(ii) * ක්ෂණිකය * පුළුල් කලාපයක් ආවරණය කරයි * එක් දිශාවකට සංදේශය ගමන් කරයි.
* එක් වරකදී තේරුම් ගත හැකි ලෙස සංදේශය ඉදිරිපත් කළ හැකිය.
* එක් එක් ග්‍රාහක කොටස් ඉලක්ක කර ගනිමින් වැඩසටහන් ඉදිරිපත් කළ හැකිය.
* අන්තර් ජාතික, ජාතික, ප්‍රාදේශීය යන ප්‍රජා ගුවන් විදුලි ජාල ඇති කරගත හැකිය.
* ශ්‍රව්‍ය මාධ්‍යක් ලෙස පරිකල්පන ශක්තිය ගොඩනැගීම අතින් ප්‍රබල ය.
* රූපවාහිනියට සාපේක්ෂව අඩු වියදම් සහිත මාධ්‍යයකි. **(ලකුණු 4)**

(iii) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය, අතථ්‍ය සන්නිවේදනය, අන්තර් පුද්ගල සන්නිවේදනය, සමූහ සන්නිවේදනය, මහජන සන්නිවේදනය, ජන සන්නිවේදනය **(ලකුණු 6)**
මූලික අදහස / විධි ක්‍රම / ප්‍රයෝජන ඇතුළත්ව විස්තර කර තිබිය යුතුය. (ල.03)

(iv) ජනකවි, ජනකතා, ශාන්තිකර්ම හා යාතු කර්ම, ගැමි නාටක **(නම් කිරීම ලකුණු 2) දෙකක් විස්තර කිරීමට 6)**

03. (i) දෙහිවල කනිෂ්ඨ විශ්වවිද්‍යාලය, පුවත්පත් කලාවේදය **(ලකුණු 2)**

(ii) * තොරතුරු හුවමාරුව සන්නිවේදනයයි. * මානව සන්නිවේදනය දෛනික ජීවිතය හා සම්බන්ධ වූවකි.
* පුද්ගල හා සමාජ සම්බන්ධතාවන්ගේ පදනම සන්නිවේදනයයි.
* සන්නිවේදනය බිඳ වැටුණු විට ඒ හා බැඳුණු සමස්ත පද්ධතියම ව්‍යාකූල වේ. **(ලකුණු 4)**


For Educational Purpose Only

SLGURU.LK

(iii) * උත්තේජනයන්ට ප්‍රතික්‍රියා දැක්වීමට
* පෞරුෂ වර්ධනයට
*තීරණ ගැනීමට
* ස්වසංකල්පය පෝෂණයට
* මතක තබාගැනීමට
* විචාරශීලිත්වය වර්ධනය කර ගැනීමට **(ලකුණු 6)**

(iv) ප්‍රතිපෝෂණය
සංදේශය නිවැරදිව ග්‍රාහයකයා ලැබුනේද යන්න දැනගත හැකිවීම.
සංදේශය නැවත සකස් කර ඉදිරිපත් කළ හැකිවීම.
සංදේශයේ සාර්ථක අසර්ථකභාවය පිළිබඳ දැනගත හැකිවීම. **(ලකුණු 8)**

04. (i) කිසියම් භාෂාවක පවතින ශබ්ද රටා සහ වචන රටා භාවිතා කරමින් සිදුකරන සන්නිවේදනය (ල. 2)

(ii) සන්නිවේදකයෝ, කේත, දොරටු පාලකයෝ, ජනමාධ්‍ය, නියාමකයෝ, පෙරහනු, ග්‍රාහක ක්ෂේත්‍රයේ, බලපෑම **(ලකුණු 4)**

(iii) තොරතුරු බෙදා ගැනීමට
කෙටි පණිවිඩ යැවීමට
ඡායාරූප හුවමාරුවට
පණිවිඩ යැවීමට
අන්‍යයන් සමඟ සබඳතා ගොඩ නගා ගැනීමට
ව්‍යාපාර හා වෙළඳ නාම ප්‍රවර්ධනයට **(ලකුණු 6)**

(iv) දැන්වීම්කරණය තුළ , නූතන නිර්මාණ තුළ, ටෙලි නාට්‍ය චිත්‍රපට තුළ, ළමා කතා නවකතා තුළ, උදාහරණ මගින් පැහැදිලි කළ යුතුය. **(ලකුණු 8)**

05. (i) ජනමාධ්‍ය මුද්‍රිත මාධ්‍ය :- පුවත් පත්, පොත්, සඟරා
විද්‍යුත් මාධ්‍ය :- ගුවන් විදුලිය, රූපවාහිනීය **(ලකුණු 2)**

(ii) * සන්නිවේදන තාක්ෂණයේ දියුණුව * ජනමාධ්‍යයේ වර්ධනය
* මධ්‍ය විසින් සමාජය වෙත කරන ලද බලපෑමේ ස්වභාවය **(ලකුණු 4)**

(iii) ව්‍යාකරණ දෝෂ
අක්ෂර දෝෂ
විරාම ලකුණු දමා නොතිබීම
අක්ෂර බොද වී තිබීම
මුද්‍රණ දෝෂ ආදී කරුණු විස්තර කරන්න. **(ලකුණු 6)**

(iv)




ශ්‍රාම් ඔස්ගුඩ් ආකෘතිය, ෂැනොන් හා වීවර්ගේ ආකෘතිය සමඟ කරුණු දෙකක් සංසන්දනය කර තිබිය යුතුය.
**(රූපසටහන - 2 විස්තරයට - 2 කාරණා විග්‍රහයට 4 - මුළු ල 8)**

06. (i) අදහස්, දැනුම යනාදිය භාෂණය හෝ ලේඛනය හෝ සංඥා මගින් ප්‍රදානය කිරීම, ප්‍රකාශ කිරීම හෝ හුවමාරු කර ගැනීම. **(ලකුණු 2)**

(ii) කිසියම් අරමුණක් සඳහා ජන සමුහයක් පොළඹවා ගැනීමට හැකිවීම.
ප්‍රස්තුත කරුණු පිළිබඳ වැඩිදුර දැනුවත් කිරීමක් සිදු කිරීම සඳහා යොදා ගැනිමට හැකිවීම.
ප්‍රතිරූප ගොඩනංවා ගැනීමට උපකාර වීම.
කිසියම් මතයක් නිර්මාණය කිරීමට හේතුවීම
විවිධ පාර්ශව වල අවධානය දිනා ගැනීමට හැකිවීම. **(ලකුණු 4)**

SLGURU.LK

For Educational Purpose Only

SLGURU.LK

(iii) තාක්ෂණික මෙවලම් භාවිතය, ආයතනික ගත ව්‍යුවහයකින් යුතුවීම, ක්ෂණික හා අඛණ්ඩ වීම, වෘත්තීය සංනිවේදකයින් සිටීම ආදිය. **(ලකුණු 6)**

(iv) පොදු කාර්යයන් වලදී පහසුවීම.
විවිධ මතිමතාන්තර අදහස් යෝජනා ඉදිරිපත් වීම.
සහභාගි වන පරිසරය ප්‍රතිචාර, ප්‍රතිපෝෂණය ලබා ගත හැකිවීම.
දැනුම සම්පත් ආදිය බෙදාගත හැකිවීම.
ආදී කරුණු හතරක් විස්තර කිරීම. **(ලකුණු 8)**

07. (i) ගැමි නාටක යනු කිසියම් කතා පුවතක් හෝ කතා පුවත් කිහිපයකින් සැදුම් ලද්දා වූ කලා අංගයකි.
උදා:- කෝලම්, සොකරි, රූකඩ **(ලකුණු 2)**

(ii) ඇස උපයෝගී කොට ගෙන දැකීමෙන් හා බැලීමෙන් අදහස් හා තොරතුරු එක් රැස් කර ගන්නේ නම් එය දෘශ්‍ය සන්නිවේදනය
ප්‍රාථමික මානවයාගේ සිට නූතන මානවයා දක්වා සන්නිවේදන කාර්යය සඳහා දෘශ්‍ය සන්නි භාවිතා කර ඇත.
දෘශ්‍ය සන්නිවේදනය යන්නට සංඥා මුද්‍රණාක්ෂර, ග්‍රැෆික් නිර්මාණ, චිත්‍ර සටහන්, වර්ණ, සජීවිකරණය චිත්‍රපට ආදී වූ අංග රැසක් අයත් වේ ආදී කරුණු දෙකක් සටහන් කිරීම ප්‍රමාණවත් වේ. **(ලකුණු 4)**

(iii) සන්නිවේදන වර්ග ස්වරූප පිළිබඳව අවධානය යොමු කිරීමෙන් එහි විවිධාකාර බව පිළිබඳව මූලික අවබෝධයක් ලබාගත හැකිවේ. මේ එක් එක් සන්නිවේදන වර්ග හා ස්වරූප විවිධ වූ සන්දර්භයන්හිදී තවදුරටත් විවිධ වෙනස්කම් හා පරිවර්තන වලට භාජනය වේ. පුද්ගලාන්තර සන්නිවේදනයට වඩා කණ්ඩායම් සන්නිවේදනය වෙනස් වෙයි. කථන සන්නිවේදනයට වඩා ලිඛිත සන්නිවේදන ස්වරූපය වෙනස් වෙයි. කථන සන්නිවේදන ස්වරූපය ආගමික සන්දර්භයකදී එක ආකාරයකටත් දේශපාලන සන්දර්භයකදී ඊට වඩා වෙනස් ආකාරයකටත් සිදුවෙයි.
ආදී වශයෙන් විස්තර කර තිබිය යුතුයි. **(ලකුණු 6)**

(iv) තොරතුරු සම්පාදනය | විනෝදාස්වාදය | අධ්‍යාපනය
සමාජානුයෝජනය | සම්බන්ධතා ගොඩනැංවීම
ආදිය විස්තර කර තිබිය යුතුය. **(ලකුණු 2 x 4 = 8වි**

NWP-EXAM

SLGURU.LK
For Educational Purpose Only